# පෘතුගීසීන් යටතේ පැවති අලි ඇතුන් වෙළෙඳාම

**එච්.එච්.එන්.එස්. හේවාවසන් ***

ශ්‍රී ලංකාවේ අලි ඇතුන් වෙළෙඳාම ආරම්භ වූයේ ශ්‍රී ලංකාවට යුරෝපීයන් පැමිණීමට පෙර සිට ය. එසේම 16 වන 17 වන සියවස්වලදී මෙම වෙළෙඳාම වඩාත් ප්‍රසිද්ධියට පත්ව තිබුණි. ප්‍රධාන වශයෙන්ම අලි ඇතුන් වෙළෙඳාම පවත්වාගෙන ගියේ ඉන්දියාව සමග ය. මෙම පර්යේෂණයේ අරමුණ වන්නේ පෘතුගීසීන් යටතේ ශ්‍රී ලංකාවේ අලි ඇතුන් වෙළෙඳාම පිළිබඳව විමර්ශනය කිරීමය.

පර්යේෂණ ක්‍රමවේදය ලෙස භාවිත කිරීමට අපේක්ෂා කරන්නේ ප්‍රාථමික හා ද්විතියික මූලාශ්‍රයන් පරිශීලනය කිරීමයි. ඒ අනුව පර්නාවෝ ද ක්වේරෝස්, ජුවාම් රුබේරු වැනි ලේඛකයන්ගේ කෘති ද ටිකිරි අබේසිංහ, සී.අර්. ද සිල්වා වැනි ලේඛකයන්ගේ කෘති ද පරිශීලනය කිරීමට අපේක්ෂිතය.

අලි ඇතුන් යනු රාජ්‍ය ඒකාධිකාරයට යටත් භාණ්ඩයක් වූයෙන් ඔවුන් ඇල්ලීම හා විකිණීම ද ඒකාධිකාරයට යටත් විය. 1597න් පසු පෘතුගිසීන් කෝට්ටේ රාජ්‍යයේ බලය ලද පසු ඔවුන්ට එම වෙළෙඳාමේ අයිතිය හිමි වූයේ 1580 දී ධර්මපාල රජු ලබා දුන් තෑගි ඔප්පුවේ හිමිකම ද පැවති නිසාවෙනි. අලි ඇතුන් ඇල්ලීම සම්බන්ධව විශේෂිත වූ රාජකාරී ක්‍රමයක් පැවතුණි. කෝට්ටේ රජ දවස පටන්ම අලි ඇතුන් ඇල්ලීම, රැක බලාගැනීම හා ඔවුන්ට ආහාර සැපයීමේ කාර්යය භාරව තිබුණේ කුරුවේ, පන්න හා පනික්කි නම් වූ පිරිසටය. මේ ක්‍රමය පෘතුගීසීන් යටතේ ද නොවෙනස්ව පවත්වාගෙන යනු ලැබීය.

පෘතුගීසීන්ට ක්‍රම තුනකින් වාර්ෂිකව අලි ඇතුන් ලබාගත හැකි විය. පාලකයන් වශයෙන් ඔවුන්ට වාර්ෂිකව නිශ්චිත අලි ඇතුන් ප්‍රමාණයක් හිමි විය. එසේම වන්නි ප්‍රදේශයෙන් ද පෘතුගීසීන්ට යම් අලි ඇතුන් ප්‍රමාණයක් හිමි වූ අතර උඩරට රාජ්‍යයෙන් ද වාර්ෂිකව අලි ඇතුන් ලැබුණ බව සඳහන් වේ. පෘතුගීසීන් යටතේ අලි ඇතුන් අලෙවි කරනු ලැබුවේ යාපනය හෝ මන්නාරම ආශ්‍රිතව පැවති වෙළෙඳපොළ මගිනි. එසේම අලි ඇතුන්ගේ මිළ තීරණය වූයේ ඔවුන්ගේ උස අනුව බව පෘතුගීසී මූලාශ්‍රයවල දක්වේ. මේ වෙළෙඳාම තුළින් ශ්‍රී ලංකාවේ පෘතුගීසී රජය විශාල ආදායමක් ඉපැයූ බව සඳහන් කළ හැකිය.

**මුඛ්‍ය පද : අලි ඇතුන් වෙළෙඳාම, පර්නාවෝ ද ක්වේරෝස්, ජුවාම් රුබේරු, කුරුවේ, පන්න, පනික්කි**

---

*** ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ඉතිහාස අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය.**